සැකසුම - එම්. ඒ. රංගන එම්. මුණසිංහ මයා

ර/නිවි/රඹුක මහා විද්‍යාලය, කලවාන.


නිපුණතා මට්ටම : නිර්දේශිත ගායනාවල සමාජීය හා සංස්කෘතික පසුබිම විස්තර කරයි.

ක්‍රියාකාරකම : කඩතුරා කවි, පන නෙළීමේ කවි, ගොයම්, සොකරි, නියමිත වන්නම්වල සංස්කෘතික පසුබිම හා ගායනාවල ස්විශේෂී ලක්ෂණ හඳුනාගනිමු.

පළමු පියවර : ඔබ පහත සටහන කියවන්න.
දෙවන පියවර : එම සටහන් කියවා, ඔබ විසින ප්‍රශ්න සකසා ඒවාට පිළිතුරු සපයන්න.

**e -** නැණ පියසට පිවිස, 9 ශ්‍රේණියේ නර්තනය විෂයට අදාල ස්ථානයේ, අදාල පාඩමට ගොස් මෙය අධ්‍යයනය කිරීමට හැකි වේ.

(යාවත්කාලීන වෙමින් පවතී)

**<u>කඩතුරා කවි ගායනාවල සමාජීය හා සංස්කෘතික පසුබිම</u>**

උඩරට, පහතරට හා සබරගමු යන සම්ප්‍රදායන්තුනට ම පොදු ගායනා විශේෂයකි බෞද්ධාගමික මුහුණුවරක් ගායනාවල අන්තර්ගත ව ඇත. ශාන්තිකර්මවල දී සුදු පිරුවටයක් ලෙස රංග සැරසිල්ල ආවරණයට භාවිත කරන තාවකාලික ආවරණය කඩතුරාව ලෙස හැඳින්වේ. විවිධ වූ නාදමාලා අනුව මෙම කවි ගායනය කෙරේ. ග්‍රාමීය ජන සමාජයේ අවශ්‍යතා පූර්ණ කිරීමට යොදාගනී. විශේෂයෙන් සෙත් ශාන්තිය අපේක්ෂාවෙන් කෙරෙන ගෘහස්ථ හා පොදු ශාන්තිකර්මවලටද යොදා ගනී. සමාජ විශ්වාස හා බැඳුණු මානව ආකල්ප මඟින් මේවාට ප්‍රමුඛ බවක් ලබා දිනි. කවි ගායනාවල බෞද්ධාගමික ලක්ෂණ ඇතුළත් ය. සිංහල සංස්කෘතිය හා බැඳුණු සාරධර්ම, චාරිත්‍ර විධි ඇතුලත්ය ශාන්තිකර්ම අවස්ථාවල දී මේවා භාවිත වී ඇත.

**<u>ගොයම් කැපීමේ ගායනාවල සමාජීය හා සංස්කෘතික පසුබිම</u>**

කෘෂිකාර්මික ජන සමාජය තුළ ජීවත් වූ මිනිසා තම වෘත්තිය ලෙස වී ගොවිතැන යොදාගෙන ඇත. මෙම කාර්යයෙහි යෙදෙන ගොවියා තම ශරීරයට දැනෙන වෙහෙස, මහන්සිය, විඩාව ,පාළුව මඟහරවා ගැනීම පිණිස ගොයම් කැපීමේ කවි ගායනා කරයි. මෙය ගැමි ජනතාවගේ සහජීවනය ඉස්මතු කරන සාමූහික ක්‍රියාවලියකි. ගැමි සමාජයේ දක්නට ලැබෙන සමාජ සාරධර්ම මෙන් ම ඔවුන් තුළ පවතින විශ්වාස කවිවලින් ගම්‍ය වේ. සරල තාලරූප හා නාදමාලා අනුව ගැමි බස් වහර පිළිබිඹුවන පරිදි මෙම කවි නිර්මාණය වී ඇති. පන් නෙළීමේ කවිවල සමාජයීය හා සංස්කෘතික පසුබිම

**<u>පන් නෙළීමේ ගායනාවල සමාජීය හා සංස්කෘතික පසුබිම</u>**

පන් කර්මාන්තයට අදාළ ව පන් නෙළීමේ කවි නිර්මාණය වී ඇත. ගැමි ජනයා තුළ පවතින සාමූහිකත්වය, එකමුතුබව හා සුහදතාව මෙම කවි ගායනා මඟින් විද්‍යමාන වේ. ඇතැම් ශාන්තිකර්මවල පන්නෙළීමේ කවි ගායනා අන්තර්ගත වී ඇති අතර ඒවා සරල තාලයකින් ද නාදමාලාවලින් ද යුක්ත වේ.

**<u>සොකරි කවිවල සමාජ හා සංස්කෘතික පසුබිම</u>**

උඩරට වන්නි ගැමි සමාජයෙහි ප්‍රචලිත සොකරි නාටකයේ දී මෙම කවි ගායනය කරනු ලබයි. සොකරි නාටකයේ අන්තර්ගත චරිත මූලික කොට ගෙන එහි කතා ප්‍රවෘත්තිය විකාශනය වන්නේ කවි ගායනා මඟිනි. එබැවින් සොකරි නාටකයෙහි ආරම්භයේ සිට අවසානය දක්වාම කවි ගායනා කරනු ලැබේ. ඒවා සරල ඒකාකාරී නදරටාවකින් යුක්තවේ. සියලුම කවි ගායනා කරනු ලබන්නේ මාත්‍රා 3 තනි තිතට අයත් ''දොං ජිජිගත'' බෙර පදයේ තාලයට අනුවය.

තව දුරටත් අධ්‍යයන කාර්යයේ නිරතවීම සඳහා සබරගමු පලාත් අධ්‍යාපන දෙපාර්තමේනිතුවේ **e -** නැණ පියසට පිවිස 9 ශ්‍රේණියේ නර්තනය විෂයට අදාල ස්ථානයට පිවිසෙන්න. www.enenapiyasa.lk

www.enenapiyasa.lk ➜ **Home page** (සිංහල තෝරාගන්න) ➜ **9 ශ්‍රේණිය** (තෝරාගන්න) ➜ **9 ශ්‍රේණිය නර්තනය** (තෝරාගන්න) ➜ **නර්තනය පාඩම්** (අදාල පාඩම තෝරාගන්න)

***